# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2022
### 2025 ජූලි
### මානවශාස්ත්‍ර පීඨය
## ක්‍රිස්තියානි සංස්කෘතිය
(නව නිර්දේශය)

### සමය දර්ශනය සහ ක්‍රිස්තියානි ධර්මයේ වර්ධනය CHCU 38224

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. සමය දර්ශනය (philosophy of Religion) පශ්චාත් නූතන යුගයට කොතෙක් දුරට බලපාන්නේ ද යන්න විස්තර කරමින් එය ලෞකිකරණය හමුවේ කෙසේ අභියෝගයට ලක්වේද යන්න සාකච්ඡා කරන්න.

02. ආගමික වත් පිළිවෙත්, මිනිස් අධ්‍යාත්මිකත්වය හා ජීවිත පරිවර්තනය යන සංකල්ප පැහැදිලි කර මේවා අතර තිබෙන සම්බන්ධතාවය පෙන්වා දෙමින් ඒවා නූතනයට කෙසේ ගැලපේදැයි විග්‍රහ කරන්න.

03. විවිධ ආගමික අත්දැකීම් මිනිස් මනස සමග ක්‍රියාකාරී වන ආකාරය එම ආගම් ඇසුරෙන් විමර්ශනයට ලක් කරන්න.

04. ආගම සහ දරිද්‍රතාවය අතර පවතින සම්බන්ධතාවය පැහැදිලි කර ආගම විසින් මිනිසුන් දරිද්‍රයක් බවට පත් කරවීම ද, ආගම දරිද්‍රයන් නඟා සිටුවීම ද සිදු කරන බව විවිධ ආගම් පාදක කරමින් සාකච්ඡා කරන්න.

05. ඓහික ආගම් (Cosmic Religions) හා ලෝකෝත්තර ආගම් (Meta-Cosmic Religions) යනු මොනවාදැයි පැහැදිලි කර සෑම ආගමකම මූලික හරය වන ශුද්ධත්වය හා අල්පේච්ඡතාවය ඇදහිලිවන්තයෙකු විසින් කෙසේ අත්දැකිය හැකිද යන්න විග්‍රහයක යෙදෙන්න.

06. තෝමස් ඇක්වයිනාස් විසින් රචිත ප්‍රධාන කෘතිවල අඩංගු මූලික සංකල්ප පිළිබඳ රචනයක් ලියන්න.

07. හිප්පෝහි අගොස්තීනුගේ (Augustine of Hippo) චින්තනය පිළිබඳ එම වකවානුවේ පැවැති භේද භේද දෙකක් වන ඩොනටියානුවාදය සහ පෙලාගියානුවාදයට එරෙහිව ඔහු ගත් ස්ථාවරයන් පැහැදිලි කර ගනිමින් සාකච්ඡා කරන්න.

08. ඇලෙක්සැන්ඩ්‍රියාවේ ක්ලෙමන්ට්ගේ (Clement of Alexandria) ධර්ම පදනම ඔහුගේ ප්‍රධාන කෘති ඇසුරෙන් විමර්ශනය කරන්න.

09. පාරිසරික දේව ධර්මයක කාලීන අවශ්‍යතාවය "වේ ප්‍රශංසා" යන විශ්ව ලේඛනය ඇසුරෙන් සාකච්ඡා කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතරෙන් කැමති මාතෘකා දෙකක් (02) යටතේ කෙටි සටහන් ලියන්න.
    - අ) ලියොන්ස්හි අයිරේනියස්
    - ආ) මාටින් ලූතර්
    - ඇ) ටර්ටූලියන්
    - ඈ) සාම දේවධර්මය
    - ඉ) කාන්තාව පිළිබඳ ක්‍රිස්තියානි චින්තනය

***************************